Australian Government

Tuition Protection Service

# අධ්‍යාපනය සපයන්නා විසින් ඔවුන්ගේ වගකීම පැහැර හැර ඇති අවස්ථාවක සිසුන් හට උපකාර කරන ක්‍රියාවලිය

ඔබගේ අධ්‍යාපනය හෝ පුහුණුව සපයන්නා:

- ආයතනය වසා දමා, ඔබ ලියාපදිංචිවූ පාඨමාලාවක් ආරම්භ කිරීමට අසමත්වූ, හෝ ආරම්භ කල පසු එම පාඨමාලාව ඉගැන්වීම නවත්වා ඇති අවස්ථාවක; සහ
- අධ්‍යාපනය සපයන්නා විසින් ඔබගේ පාඨමාලා ගාස්තු නැවත ගෙවීමට නොහැකි, ක්‍රියාකාරී ලෙස ඔබගේ පාඨමාලා ගාස්තු නැවත නොගෙවන හෝ වෙනත් අධ්‍යාපනය සපයන්නෙකු සමඟ ඔබගේ අධ්‍යාපන කටයුතු අවසන් කිරීමට පිළියෙල කර නොදෙන අවස්ථාවක.

TPS (Tuition Protection Service) (ඉගැන්වීම ආරක්ෂා කරන සේවාව) මගින් මෙය **'අධ්‍යාපනය සපයන්නාගේ පැහැර හැරීම' ('provider default')** ලෙස නම් කරයි.

**TPS** මගින් ඔබගේ අධ්‍යාපනය සපයන්නා හට ලබා දුන් ඔබ හා සම්බන්ධවීමේ විස්තර උපයෝගී කර ගනිමින් ඔබ හා සම්බන්ධ වනු ඇත.

ඔබ විසින් මීළඟට කලයුතු දේ සම්බන්ධ උපදෙස් ලබා දීමට සහ TPS මාගර්ස්ථ අවස්ථා කළමණාකරණ පද්ධතිය (online management system) භාවිතා කරන ආකාරය සම්බන්ධ තොරතුරු සැසියකට සහභාගිවන ලෙස **TPS** විසින් ඔබට ආරාධනා කරනු ඇත.

ඔබට ලොග් ඉන් වීම සඳහා **TPS** විසින් ඊමේල් පණිවුඩයක් එවනු ඇත. www.tps.gov.au ඔස්සේ **ඔබට** මාගර්ස්ථ විකල්පය වෙත ප්‍රවේශ විය හැකිය.

**ඔබ** TPS මාගර්ස්ථ විකල්පය වෙත ලොග් ඉන් වීම.

TPS මාගර්ස්ථ විකල්පයේ **ඔබගේ** පාස්වඩර්ය (password) වෙනස් කල යුතු අතර, ඔබගේ අධ්‍යාපනය සපයන්නා විසින් ඔබට ඇති වගකීම් ඉටුකර ඇතිද යන්න දක්වා, ඔබගේ අනන්‍යතා ඡායාරූප එක් කර (ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය), ඔබගේ සම්බන්ධවීමේ තොරතුරු යාවත්කාලීන කල යුතුය.

**TPS** මගින් ඔබගේ අධ්‍යාපනය සහ පුහුණුව ආරම්භ කිරීම/දිගටම කිරීම සඳහා සුදුසු විකල්ප ඕස්ට්‍රේලියානු අධ්‍යාපනය සපයන්නෙකු සොයා ගැනීමට ඔබට උපකාර කරනු ඇත.


සුදුසු විකල්ප අධ්‍යාපනය සපයන්නෙකු සොයා ගත නොහැකි නම්, හෝ පාඨමාලාව මාරු කිරීමේ කාලය අවසන් නම්, ඔබ විසින් ගෙවා ඇති ගාස්තුවලින් අධ්‍යාපනය සපයන්නා විසින් ඔබගේ අධ්‍යාපනය සහ පුහුණුව සම්බන්ධයෙන් භාවිතා කර නොමැති කොටස සම්බන්ධයෙන් ඔබ විසින් නැවත ලබා ගැනීමට ඉල්ලා ඇති ප්‍රමාණය සම්බන්ධ ඇගයීමක් **TPS** කරනු ඇත.

TPS මෙය හඳුන්වන්නේ **'වියදම් නොකල පාඨමාලා ගාස්තු'** වශයෙනි.

**ඔබ** විසින් TPS වෙත ඔබගේ අධ්‍යාපනය සපයන්නා වෙත ගෙවන ලද ඔබගේ පාඨමාලා ගාස්තු (සහ ඔබට නියෝජිතයෙකු ඇතිනම් ඔවුන් විසින් ගෙවූ) සම්බන්ධ සාක්ෂි ලබා දිය යුතුය. ඔබට නැවත ගෙවන ප්‍රමාණය ගණනය කිරීම සඳහා මේවා අත්‍යාවශ්‍යවේ.

**TPS** විසින් ඔබට නැවත ගෙවිය යුතු ප්‍රමාණය ගණනය කර මාගර්ස්ථ විකල්පය භාවිතා කර ඔබගේ බැංකු ගිණුම සම්බන්ධ විස්තර ලබා දෙන ලෙස ඉල්ලා ඊමේල් පණිවුඩයක් එවනු ඇත.

TPS මාගර්ස්ථ විකල්පය භාවිතා කර ඔබගේ බැංකු ගිණුම සම්බන්ධ විස්තර **ඔබ** ලබා දෙනු ඇත. ඔබ විසින් නම් කරන ලද බැංකුව වෙත වියදම් නොකල පාඨමාලා ගාස්තු **TPS** වෙතින් ලබා දෙනු ඇත.



ඔබ ජාත්‍යන්තර සිසුවෙකු නම්, ඔබගේ ශිෂ්‍ය වීසා බලපත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා මාස තුනක් ඇතුලත ඕස්ට්‍රේලියාවේ දිගටම අධ්‍යාපන කටයුතු කිරීම සඳහා වෙනත් අධ්‍යාපනය සපයන්නෙකු සමඟ **ඔබ** පාඨමාලාවකට ලියාපදිංචි විය යුතුය.

**ඔබ** ඕස්ට්‍රේලියාවේ දිගටම අධ්‍යාපන කටයුතු සිදු කරයි.